# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 3 දරන ලංකා අද්මිරාල්ති අධිකරණ (සංශෝධන) පනත

[ශෘහතිකය සටහන් කළේ 1972 සැප්තැම්බර් මස 21 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 ඔක්තෝබර් මස 6 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතය

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 3 දරන ලංකා අද්මිරාල්ති අධිකරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 සැප්තැම්බර් මස 21 වන දින.]

එල්.ඩී.—ඕ. 26/72.

ලංකා අද්මිරාල්ති අධිකරණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 3 දරන ලංකා අද්මිරාල්ති අධිකරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. ලංකා අද්මිරාල්ති අධිකරණ ආඥාපනතේ 21 වන වගන්ති යට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළු කරනු ලබන අතර, එය එහි 21අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :— — 9 වන අධිකාරයෙහි 21අ වන අලුත් වගන්තිය ඇතුළු කිරීම.

“ අභියාචනා මහාධිකරණය වෙත අභියාචනා කිරීම.

21අ. (1) අන් කිසි නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද එය නොතකා යටත් විජිත අද්මිරාල්ති අධිකරණයේ අභියාචනා හෝ මුල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි දී ඒ අධිකරණ ය විසින් දෙන ලද අවසාන නඩු තීන්දුවකට විරුද්ධව, 1971 අංක 44 දරන අභියාචනා මහාධි කරණ පනත යටතේ පිහිටුවන ලද අභියාචනා මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි විය යුතු ය.

(2) 1971 අංක 44 දරන අභියාචනා මහාධිකරණ පනත යටතේ සාදන ලද අධිකරණ නීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන 1971 අංක 44 දරන අභියාචනා මහාධි කරණ පනත ආරම්භ වූ දිනයෙහි සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.”.